International
Labour
Organization

# දැනට පවතින ආර්ථික අභියෝග හමුවේ වඩාත් අවදානමට ලක්විය හැකි අයට කෙටිකාලීන ආදායම් උත්පාදන සහාය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සහාය

## ඉලක්කගත ප්‍රතිචාර ගණනාවක් මගින් උතුරු පළාතේ තරුණයින්, ආබාධ සහිත පුද්ගලයන් සහ කාන්තා ගෘහ මූලිකයන් සඳහා ආධාර කිරීමට ප්‍රමුඛත්වය

වහාම නිකුත් කිරීම සඳහා 2023 පෙබරවාරි 9

කොළඹ **(ILO පුවත්)**: මන්නාරම, කිලිනොච්චි, වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවල අවදානමට ලක්විය හැකි කාන්තාවන් සහ පිරිමින් 3,725 දෙනෙකුට කෙටිකාලීන සහන යාන්ත්‍රණ කිහිපයක් හරහා ආදායමක් උපයා ගැනීම සහ ජීවනෝපාය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහාය දක්වයි. කෘෂිකර්මාන්තය සඳහා වාරිමාර්ග වැඩිදියුණු කිරීම, ගොවිපළ ප්‍රවේශ මාර්ග පිරිසිදු කිරීම සහ ධීවර තොටුපළ ප්‍රතිසංස්කරණය කිරීම හා ඒ ආශ්‍රිත තාවකාලික රැකියා සැපයීම මෙන්ම සහන මිලට බීජවල සිට උපකරණ දක්වා කෘෂිකාර්මික යෙදවුම් සැපයීම, ශ්‍රමය සහ ඉඩම් සකස් කිරීම සඳහා මූල්‍ය ආධාර මෙන්ම පෞද්ගලික අංශය හරහා වෙළඳපොළ ප්‍රවේශය ශක්තිමත් කිරීම මෙයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාව එහි දරුණුතම ආර්ථික අර්බුදය අත්විඳින අතර එහි ජනගහනයෙන් 30%කට ආසන්න ප්‍රමාණයක් ආහාර අනාරක්ෂිතතාවයට මුහුණ දී සිටිති. ඉහළ යන දරිද්‍රතා අනුපාතය තවත් පවුල් දරිද්‍රතා රේඛාවෙන් පහළට තල්ලු කරමින් සිටිති. “ඕනෑම අර්බුදයකදී වඩාත්ම බලපෑමට ලක්වන්නේ දැනටමත් අවදානම්වලට මුහුණදෙමින් සිටින පුද්ගලයන් ය. උතුරු පළාත යනු දැනටත් ජාතික සාමාන්‍ය විරැකියාවට හා දරිද්‍රතාවට වඩා වැඩි තත්වයක් පවතින කලාපයකි. එහි ජනතාවගේ එදිනෙදා ජීවනෝපාය කටයුතු කරගෙන යාමේදී තවදුරටත් තීව්‍ර වූ අභියෝග සමඟ පොරබදන්නට ඔවුන්ට සිදුවී තිබේ. විශේෂයෙන්ම කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයේ නියැලී සිටින අයගේ ජීවනෝපාය සෑම අංශයකින්ම දැඩි ලෙස කඩාකප්පල් වී තිබේ,” යි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා ප්‍රධාන තාක්ෂණික උපදේශක ආචාර්ය තෝමස් ක්‍රිං පවසයි.

මෙම තත්වයට මැදිහත්වීම් ලෙස, ආර්ථික සංවර්ධන සහ ප්‍රතිසන්ධානය හරහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය සිදුකරන Local Empowerment through Economic Development and Reconciliation (LEED+), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ සමුපකාර සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කරමින් තිබේ. විනයාගපුරම් ගොවි සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී මුරුගේසපිල්ලේ මුරලිදරන් මෙම වැඩසටහන පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පැවසීය: “කෘෂිකාර්මික කටයුතු අඩාල වීමත් සමඟ ගොවීන්, කෘෂි කම්කරුවන්, දෛනික වැටුප් ලබන්නන් යන සියලු දෙනාටම ආදායම අහිමි වුණා. මෙම වැඩසටහන හරහා ලැබෙන ඉපැයීම්වලින්, පුද්ගලයන්ට නිවසේ වියදම් කළමනාකරණය කර ගැනීමට, තම දරුවන් පාසල් යැවීමට, වෛද්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට, ගෙවත්තක් ආරම්භ කිරීමට, සහ ගොවිතැන කරගෙන යාමට අවශ්‍ය බීජ මිලදී ගැනීමට මෙන්ම අනෙකුත් අවශ්‍යතා සඳහාද හැකියාව ලැබෙනවා. මෙම ප්‍රදේශයේ අප අවසන් කර ඇති නඩත්තු කටයුතු හේතුවෙන් ඉදිරි වසර 4 සිට 5 දක්වා කාලය තුළ අපගේ ක්ෂේත්‍රවලට ප්‍රතිලාභ ලැබෙනු

Press Release

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org

For information only. Not an official record.

International Labour Organization

ඇති. මේ සම්බන්ධයෙන් සාමූහිකව වැඩ කිරීම මගින් ප්‍රජාව සහ හිමිකාරිත්වය පිළිබඳ ප්‍රබල හැඟීමක් ද ප්‍රජාව තුළ ඇති වෙනවා.”

යටිතල පහසුකම් සංවර්ධන මැදිහත්වීම හරහා කුඩා පරිමාණ වැව් දෙකක් පිළිසකර කරන ලදි. ඊට අමතරව වාරිමාර්ගවල රොන් මඩ අයින් කිරීම සහ පිරිසිදු කිරීම ද සිදු කරන ලදි. කුඹුරු අක්කර 2028 ක් සඳහා ගොවිපළ මාර්ග ප්‍රවේශය වැඩිදියුණු කරන ලදි. ධීවර තොටුපළ 4 ක් සහ වෙරළ ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 40 කට වැඩි ප්‍රමාණයක් ද එළිපෙහෙළි කරන ලදි.

“ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වැඩ පදනම් කරගත් මුදල් සම්පාදන ප්‍රවේශයේ බලපෑම බොහෝ ආකාරවලින් දැකිය හැකිය. 2022දී රජය විසින් වියදම් සීමා කිරීමහේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සාමාන්‍ය නඩත්තු කටයුතු ඇනහිට ඇත. මෙම මැදිහත්වීම මගින් ආබාධ සහිත පුද්ගලයන් සහ කාන්තා ගෘහ මූලිකයන් ඇතුළු අභිභකම් වැඩි පුද්ගලයන් සඳහා සෘජු ආදායම් මාර්ගයක් සපයා දෙන ලදි. ඊට සමගාමීව අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයන් සම්පූර්ණ කිරීම සඳහා යාන්ත්‍රණයක් ද නිර්මාණය කරන ලදි. මෙමගින් ඉදිරි කන්නයේදී ගොවීන්ට තම කෘෂිකාර්මික කටයුතු කරගෙන යාමට හැකි බව සහතික වෙනවා,” යැයි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් රාජරත්නම් පරනිහරන් මහතා පැවසීය.

කරවල නිෂ්පාදනය, දැල් අළුත්වැඩියා කිරීම සහ මුහුදු ආහාර සැකසුම් කර්මාන්තශාලාවල රැකියාවල නිරත වන කාන්තාවන්ගේ ජීවනෝපාය ධීවර කර්මාන්තය මත රඳා පවතින බව අන්බුපුරම් ධීවර සමුපකාරයේ භාණ්ඩාගාරික අමීර් ලෝගාදේවි විසින් අවධාරණය කරන ලදි. “බෝට්ටු මුහුදට නොයන විට, කාන්තාවන් වන අපට ජීවත් වීමට මාර්ගයක් නැහැ. ඒ නිසා, ඔවුන් ඉහළ පොලී අනුපාතවලට මුදල් ණයට ගැනීම, වත්කම් විකිණීම, දිනකට එක් ආහාර වේලකට යොමු වීම, අනතුරුදායක වැඩවල නියැලීම ධීවර පවුල් අතර බහුලව දක්නට ලැබුණා. ඒවායිනුත් කළ හැක්කේ මූලික අවශ්‍යතා සපුරාලීම පමණයි. මෙම වැඩපිළිවෙළ හරහා යම් තරමකට හෝ දුෂ්කරතා සමනය කර ගැනීමට ධීවර පවුල්වලට හැකි වුණා.”

ආධාරවල විෂය පථය පුළුල් කරමින්, LEED+ විසින් තරුණයින් 1000කට ඔවුන්ගේ පෙර ඉගෙනීම සඳහා පිළිගැනීමක් (RPL) ලබා දීම සහ ඔවුන්ගේ සේවා නියුක්තිය ශක්තිමත් කිරීම සිදුකරයි. එමෙන්ම ආර්ථික අර්බුදයට අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීමේ කොටසක් ලෙස බඩ ඉරිඟු සහ රටකජු ගොවීන් 600කට සහාය ලබා දෙනු ඇත.

ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT) සහ නෝර්වේ රජය විසින් සහාය දක්වන ලද LEED+ ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සාමය සහ ඔරොත්තු දීම සම්බන්ධ (Jobs for Peace and Resilience) ගෝලීය රැකියා වැඩසටහනේ කොටසකි.

වැඩිදුර විස්තර: කෞශල්‍යා කදිරේෂන් මිය, ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය කාර්යාලය - kathireson@ilo.org

Web Facebook Twitter Flickr Youtube

Press Release

ILO Office for Sri Lanka and the Maldives
202 – 204, Bauddhaloka Mawatha,
Colombo 7,
Sri Lanka.

Tel. +94 11 259 2525
Fax. +94 11 250 0865
E-mail: colombo@ilo.org

*For information only. Not an official record.*